# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2354/16 - 2023 ඔක්තෝබර් මස 18 වැනි බදාදා - 2023.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/1978 (X)(B)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, මේ නියමය මඟින් මිනුම් හා සිතියම් ආයතනය සම්බන්ධයෙන් එකී පනත යටතේ සාදන ලද සහ 1990 ජූලි මස 24 වන දින අංක 620/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ "විද්‍යාවේදී (මිනුම් විද්‍යා) උපාධි පිරිනමනු ලැබීමට මඟ සලසන මිනුම් ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා එකී ආයතනය උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස මේ නියමය මඟින් පිළිගනිමි." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි මිනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබීමට මඟ සලසන මිනුම් ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා එකී ආයතනය උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස මේ නියමය මඟින් පිළිගනිමි.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. මිනුම් හා සිතියම් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මිනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියට සිසුන් ඇතුළත්කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (SLQF) 6 වන මට්ටම) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයන් ඇතුළත්ව කවර හෝ විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. මෙම ගැසට් පත්‍රය පළකරන දිනයේ සිට මෙම අවම ඇතුළත් කරගැනීම් සුදුසුකම් බලාත්මක වේ.

3. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයට යටත්ව මිනුම් හා සිතියම් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සිදුකළ යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| මිනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (මිනුම් විද්‍යාව) ” |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත**,
අධ්‍යාපන අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.